සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# භූගෝල විද්‍යාව

**09 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 10 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01 නිල් ග්‍රහයා ස්වකීය අක්ෂය වටා ...................................... වෙමින් සූර්යයා වටා ඉලිප්සාකාර මාර්ගයක ගමන් කරයි. (පරිභ්‍රමණය / භ්‍රමණය / චලනය)

02 වැඩි පීඩන කලාපවල සිට අඩු පීඩන කලාප දක්වා නිතර සුළං හැමීම ................................................ තුළ සිදුවේ. (අයන ගෝලය / අපරිවර්ති ගෝලය / පරිවර්තී ගෝලය)

03 වියළි කාන්තාර සහිත ආසියා කලාපය වන්නේ .................................................... යි. (දකුණු ආසියාව / ගිණිකොන ආසියාව / නිරිතදිග ආසියාව)

04 බෝල්ටික් පළිහ ප්‍රදේශය .................................................... ට අයිති භූ ලක්ෂණයකි. (ඇමෙරිකාව / ඉන්දියාව / රුසියාව)

05 ආසියා මහාද්වීපය අප්‍රිකානු මහාද්වීපයෙන් වෙන් වන්නේ ................................ හා සූවස් ඇළ මගිනි. (යුරල් කඳු / රතු මුහුද / කැස්පියන් මුහුද)

06 උතුරු ආසියා ප්‍රදේශයට .............................. ගඟ අයත්වේ. (සිකියැං / ගංගානම් / යෙනිසි)

07 ආසියාවේ කොඳු නාරටිය ලෙස සලකන්නේ ................................. කඳු මැදි කරගෙන විවිධ දිශාවලට ඇති කඳු පද්ධතිය වේ. (පාමීර් / මහාබාධක / ඇන්ඩීස්)

08 ශීත දේශගුණික ප්‍රදේශවල ................................... වනාන්තර ඇසුරින් දැව කර්මාන්තය කරනු ලැබේ. (පතනශීල / නිවර්තන / කේතුධර)

09 සාම ස්මාරකය ...................................... රටෙහි ලෝක උරුමයක් ලෙස නම් කර ඇත. (චීන / ජපන් / ලාඕස)

10 අලංකාර මැටි බඳුන් ඔපමට්ටම් කර සැකසීම ....................................... නිම්න වැසියන්ගේ සුවිශේෂී කාර්යයකි. (ඉන්දු / යුප්‍රටීස් ටයිග්‍රීස් / හොවැංහෝ)

- අංක 11 20 දක්වා වූ ප්‍රකාශන හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

11 විශේෂිත කර්මාන්ත කලාප බිහිවීම ඉන්දියාවේ කර්මාන්ත අතින් සිදුවූ ප්‍රවණතාවයකි. ( )

12 ලෝකයේ ජනාධික කලාප වලින් තුනක්ම අයත්වන්නේ ආසියා කලාපයට වේ. ( )

13 බිම්ස්ටෙක් සංවිධානයට දකුණු ආසියානු රටවල් පමණක් අයත් වේ. ( )

14 මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ප්‍රථම අදියර ආරම්භ කළේ පොල්ගොල්ල ව්‍යාපාරයෙනි. ( )

15 රාජ්‍ය අංශයේ එකම රසායන ද්‍රව්‍ය කම්හල උතුරු ප්‍රදේශයේ පිහිටා ඇත. ( )

16 මොණරාගල දිස්ත්‍රික්කයෙන් වැඩි කොටසක් මධ්‍ය කඳුකරයේ බටහිර බෑවුමෙහි පිහිටා ඇත. ( )

17 දක්ෂිණ ලංකා සංවර්ධන සැලැස්ම දියත්කරන ලද්දේ ඌව ප්‍රදේශයට වේ. ( )

18 නිල්වලා ව්‍යාපෘතිය ගංවතුර පාලනය සඳහා ක්‍රියාත්මක කළ එකකි. ( )

19 ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශයේ වියළි කලාපීය මෝසම් වනාන්තර සුලබව පවතී. ( )

20 ''තොටුපල අරුණ'' වැඩසටහන ධීවර ගම්මාන සඳහා පහසුකම් සැපයීමට සිදුකළ ව්‍යාපෘතියකි. ( )

● අංක 21  30 දක්වා වූ ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.

21 දර්ශනීය වෙරළ ස්ථානයක් ලෙස ........................................................................... දැක්විය හැකිය.

22 ඌව පළාතට බදුල්ල හා ........................................................................... දිස්ත්‍රික්ක අයත්වේ.

23 මිනිසා හා පරිසරය අතර නොබිඳිය හැකි සබඳතාව .................................................. නායක සියැට්ල් පෙන්වා දී ඇත.

24 පරිසරය මිනිසාට ස්වාභාවිකව දායාද කර ඇති දෙයට වඩා වැඩි දෙයක් පරිසරයෙන් ලබාගැනීමෙන් .................................................................. බිඳවැටේ.

25 රටක ආර්ථික, සමාජයීය හා පාරිසරික තත්ත්වයන්ට ඔරොත්තු දිය හැකි සංවර්ධන ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ....................................................... සංවර්ධනය වේ.

26 1987 කැනඩාවේ ................................................ නගරයේ දී සම්මුතිය මගින් CFC වායු නිෂ්පාදනය හා පරිහරණය සීමා කරන ලදී.

27 වෙරළ කලාපයේ සම්පත් පිළිබඳ ගවේෂණය මෙන්ම වෙරළ කලාපය ............................ කිරීම වෙරළ සංරක්ෂණ පණතේ අරමුණු වේ.

28 ශ්‍රී ලංකාවේ විශාලම භූමි ප්‍රමාණයක් හිමි පළාත ................................................. පළාත වේ.

29 රටේ සමාජයීය සංවර්ධනය යටතේ වැසි ජලය රැඳවුම් ටැංකි වඩාත් ප්‍රයෝජනවත් වූයේ ................................................ වැසියන්ට ය.

30 අවිස්සාවේල්ල කාර්මික ජනපදය ........................................................ දිස්ත්‍රික්කයට අයිති වේ.

● අංක 31  40 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

31 උතුරු ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා ආරම්භ කර ඇති වැඩ සටහන මින් කුමක් ද?

(1) උතුරු හිරු කිරණ (2) උතුරු වසන්තය

(3) උතුරු දකුණු සමෘද්ධිය (4) උතුරු සංහිඳියාව

32 පැසිපික් සාගරය දෙපස පිහිටි රටවල් එකමුතු වී වෙළඳාම පිළිබඳ අභියෝග අවම කිරීමට පිහිටුවා ඇති සංවිධානය මින් කුමක් ද?

(1) APEC (2) SAARC (3) ASEAN (4) BIMSTEC

33 මෙම ප්‍රදේශවලින් සංචරණ සත්ත්ව පාලනය සිදුකරන ප්‍රදේශය තෝරන්න.

(1) දකුණු හා ගිනිකොන ආසියාව (2) ඉන්දියාවේ නැගෙනහිර වෙරළ

(3) මධ්‍යම ආසියාවේ ස්ටෙප්ස් ප්‍රදේශය (4) අප්‍රිකාවේ දකුණු වෙරළ ප්‍රදේශය

34 කෘෂිකාර්මික පර්යේෂණවල ප්‍රතිඵල බහුලව භාවිතා කරන්නේ මින් කවර කෘෂිකාර්මික ක්‍රමයක් යටතේ ද?

(1) සල ගොවිතැන (2) ව්‍යාපාරික වතු කෘෂිකර්මය

(3) පාරිභෝගික කෘෂිකර්මය (4) සංචරණ සත්ත්ව පාලනය

35 හෙල්මළු ක්‍රමය යටතේ වී වගා කරන ප්‍රදේශයක් ලෙස දැක්විය හැකි ප්‍රදේශය මින් කුමක් ද?

(1) අනුරාධපුරය (2) පොළොන්නරුව (3) ගම්පොල (4) අම්පාර

36 සාම ස්මාරකය, ඇන්කෝර් විහාරය, බාමියන් ප්‍රතිමා ඇති රටවල් පිළිවෙළින් දැක්වෙන පිළිතුර මින් කුමක් ද?

(1) ඇෆ්ගනිස්ථානය, චීනය, මොංගෝලියාව

(2) ජෝර්දානය, මක්කම, මැලේසියාව

(3) චීනය, ඉන්දියාව, ජෝර්දානය

(4) ජපානය, කාම්බෝජය, ඇෆ්ගනිස්ථානය

37 නව කාර්මික රටවල වැදගත්ම කර්මාන්තයක් ලෙස සැලකිය හැක්කේ මින් කුමක් ද?

(1) ඉලෙක්ට්‍රොනික එකලස් කිරීමේ කර්මාන්තය

(2) ගුවන් යානා එකලස් කිරීමේ කර්මාන්තය

(3) මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය

(4) නැව් නිෂ්පාදන එකලස් කිරීමේ කර්මාන්තය

38 කොළඹ පුරවර ප්‍රදේශයට අදාළ නොවන ප්‍රකාශය මින් තෝරන්න.

(1) කෙටි කලක් තුළ නවෝදයක් ලැබීම.

(2) ප්‍රධාන වෙළඳ නගර පැවතීම.

(3) අඩු භූමි ප්‍රමාණයක ජන සංඛ්‍යාවෙන් විශාල කොටසක් සිටීම.

(4) දෛනික මානුෂ සචලතාවය පහළ අගයක් ගැනීම.

39 උතුරු ප්‍රදේශයේ පවතින කර්මාන්ත පමණක් පවතින පිළිතුර තෝරන්න.

(1) සංචාරක, ලුණු, කජු නිෂ්පාදනය

(2) රසායන ද්‍රව්‍ය, සිමෙන්ති, ඛනිජ වැලි නිෂ්පාදනය

(3) ධීවර, උළු ගඩොල්, රෙදිපිළි නිෂ්පාදනය

(4) සිමෙන්ති, පිඟන්, දව නිෂ්පාදනය

40 ලාහුගල රක්ෂිත වනෝද්‍යානයෙන් කොටසක් අයත් වන්නේ මින් කවර දිස්ත්‍රික්කයට ද?

(1) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය (2) අම්පාර දිස්ත්‍රික්කය

(3) බදුල්ල දිස්ත්‍රික්කය (4) මොනරාගල දිස්ත්‍රික්කය

(1 x 40 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01 ඔබ 9 ශ්‍රේණියේ දී සකස් කළ භූ ලක්ෂණ සිතියම් ආශ්‍රිත පැවරුම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) පහත දැක්වෙන ලක්ෂණවලින් භෞතික හා මානුෂ භූ දර්ශනයේ ලක්ෂණ වෙන්කර දක්වන්න.
(පළාත් මායිම / කඳුවැටිය / වී වගාව / දළ බෑවුම / නෙරුව / ග්‍රාම නිලධාරි මායිම / හුදකලා කන්ද / සානුව / වැව / ත්‍රිකෝණමිතික ස්ථානය) (ල. 05)

(2) 1 : 50000 සිතියම්වල දැක්වෙන රේඛීය පරිමාණය ඇඳ දක්වන්න. (ල. 02)

(3) 1 : 50000 සිතියමක දැක්වෙන 4cm ක් දිග හා 2cm ක් පළල මල් පාත්තියක සැබෑ වර්ගඵලය ගණනය කරන්න. (ල. 02)

(4) දකුණුපස දක්වා ඇති රූප සටහන්වල දැක්වෙන්නේ සිතියම්වල භාවිතා වන භූ ලක්ෂණ කිහිපයකි. ඒවා හඳුනාගෙන නම් කරන්න.







A - B බෑවුම

x - y භූ ලක්ෂණය

C- D බෑවුම (ල. 03)

02 මෙහි දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශයට අයත් සිතියම් කොටසකි.




(1) එම සිතියමේ A, B හා C ලෙස දැක්වෙන දිස්ත්‍රික්ක හා ඒවායේ පිහිටි ප්‍රධාන නගර අක්ෂර අනුව නම් කරන්න. (ල. 04)

(2) මෙම ප්‍රදේශයට රටේ භූමි භාගයෙන් කොපමණ ප්‍රමාණයක් අයත්වේ ද? (ල. 02)

(3) මෙම ප්‍රදේශයේ වී වගාව සඳහා ජලය සපයා ගන්නා ආකාර 3 ක් දක්වන්න. (ල. 03)

(4) මෙම ප්‍රදේශයේ පවතින භෞතික සම්පත් වර්ග 3 ක් දක්වන්න. එම සම්පත් පිහිටි ප්‍රදේශ එක බැගින් ලියන්න. (ල. 03)

03 (1) පහත දැක්වෙන ලක්ෂණ අයත්වන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක නම්කර දක්වන්න.
(මාස හතරකට වැඩි නියං කාලයක් පැවතීම / දර්ශනීය වෙරළ තීරය / කජු හා තල් වැවීමේ ව්‍යාපෘතිය / සිලිකා වැලි නිධියක් පැවතීම / අර්ධ ශුෂ්ක දේශගුණය) (ල. 05)

(2) දකුණු ප්‍රදේශයේ පවතින ප්‍රධාන කර්මාන්ත තුනක් නම්කර ඒ සඳහා එම ප්‍රදේශයෙන් යොදාගන්නා අමුද්‍රව්‍ය තුනක් දක්වන්න. (ල. 03)

(3) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධනය සඳහා ආරම්භ කරන ලද ව්‍යාපෘති ඒ ඒ ප්‍රදේශ තුනක් ඇසුරින් කෙටියෙන් පහදන්න. (ල. 04)

04 ආදිකාලයේ සිටම මිනිසා පරිසරය සමග මිත්‍රශීලීව සම්බන්ධතා පවත්වා ඇත. වර්තමානයේ මිනිසා පරිසරය අධික ලෙස ප්‍රයෝජනයට ගැනීමේ ප්‍රයත්නයක යෙදී සිටින නිසා පරිසර ආචාරධර්ම පිළිපැදීමේ අවශ්‍යතාව දැඩිව කැපී පෙනේ.

(1) මිනිසා පරිසරය අධික ලෙස ප්‍රයෝජනයට ගැනීමට හේතු තුනක් ලියන්න. (ල. 03)

(2) පරිසර තුලිතතාවය බිඳවැටීම නිසා ඇතිවන ප්‍රතිඵල 3 ක් දක්වන්න. (ල. 03)

(3) පරිසර තුලිතතාව ආරක්ෂා කර ගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග 4 ක් දක්වන්න. (ල. 04)

(4) ජාත්‍යන්තර මට්ටමින් සංවිධානය කර ඇති පරිසර සංරක්ෂණ ප්‍රතිපත්ති 2 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

05 (1) පුරවර ප්‍රදේශයක් යනු කුමක් ද? (ල. 02)

(2) කොළඹ පුරවර ප්‍රදේශයට අයිති දිස්ත්‍රික්ක නම් කරන්න. (ල. 03)

(3) කොළඹ පුරවර ප්‍රදේශය තුළ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ 4 ක් දක්වන්න. (ල. 04)

(4) කොළඹ පුරවර ප්‍රදේශය වර්තමානයේ මුහුණ දී තිබෙන ගැටළු 2 ක් දක්වා එම ගැටළු විසඳීමට ගෙන ඇති ක්‍රියාමාර්ග 2 ක් විස්තර කරන්න. (ල. 03)

06 මහවැලි ගංගාවෙන් ජලය සැපයෙන ප්‍රදේශයටම සීමාවූ ව්‍යාපෘතියක් නොවන මහවැලි සංවර්ධන ව්‍යාපාරය ශ්‍රී ලංකාවට විශාල බලපෑම් රැසක් ඇතිකර දුන් මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතියකි.

(1) මහවැලි සංවර්ධන ව්‍යාපෘතියට සම්බන්ධව බිහිවී ඇති ජලාශ 3 ක් ද, නගර තුනක් ද දක්වන්න. (ල. 03)

(2) ශ්‍රී ලංකාවේ සෙසු ප්‍රදේශවලට වඩා මහවැලි සංවර්ධන ප්‍රදේශයට විශේෂත්වයක් හිමිවීමට හේතු 3 ක් ලියන්න. (ල. 03)

(3) ජාතික මට්ටමේ සංවර්ධනය උදෙසා මහවැලි සංවර්ධන ව්‍යාපාරය මගින් ලද ප්‍රතිලාභ 3 ක් දක්වන්න. (ල. 03)

(4) මහවැලි කලාපය තුළ ජනාවාසකරණයේ දී මූලිකත්වය ලබාදී ඇති පවුල් ඒකක කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

07 (1) ආසියානු කලාපයේ තිබෙන පහත සඳහන් කර්මාන්ත පවතින රටවල් 2 බැගින් දක්වන්න.
(විද්‍යුත් කර්මාන්තය / ගුවන් යානා කර්මාන්තය / මෝටර් රථ කර්මාන්තය / නැව් කර්මාන්තය) (ල. 04)

(2) නව කාර්මික රටවල වේගවත් කාර්මික දියුණුවක් ඇතිවීමට බලපෑ හේතු තුනක් දක්වන්න. (ල. 03)

(3) ආසියානු කලාපීය රටවල ජනතාව මුහුණ දෙන අභියෝග 3 ක් දක්වා ඊට එම රටවල් ගෙන ඇති ක්‍රියාමාර්ග කෙටියෙන් පහදන්න. (ල. 05)